Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE

MINISTÈRE DE LA JUSTICE

8

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## (මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරනු ලබන) පරීක්ෂණය අවසන් වන තුරු රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයකු සතු ව ඇති සහන

ඔබ ව රිමාන්ඩ් භාරයට පත් කර ඇත්තේ සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් භාර විනිසුරුවරයා විසිනි. ඔබ විසින් පිළිසරණ පැතිය හැකි මූලික අයිතිවාසිකම් සහ ඔබ හට ලබා දිය යුතු මූලික තොරතුරු මෙම ලේඛනයෙන් දක්වා ඇත.

***<u>රිමාන්ඩ් භාරයේ සිටින මුළු කාල සීමාව පුරාවට ම ඔබට මෙම ලේඛනය ඔබ සන්තකයේ තබා ගත හැක.</u>***

### වරදකාරී ක්‍රියාව සිදු කිරීම පිළිබඳ දැනුම

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද පොලිස් අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

### නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම

පරීක්ෂණය පවතින මුළු කාල සීමාව පුරාවට ම ඔබ විසින් තෝරා පත් කළ හෝ ඔබ වෙනුවෙන් පත් කළ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.

ඔබගේ නීතිඥවරයා සමග නිදහසේ අදහස් හුවමාරු කර ගැනීමට හෝ ලිඛිත මාර්ගයෙන් සන්නිවේදනය කිරීමට ඔබට හැකියාව ඇති අතර ඔබට අදාළ සියලු විභාග කිරීම් වල දී ඔහුගේ සහාය ලබා ගැනීමට හැකි අතර අදාල විභාග කිරීම් පිළිබඳ ව නීතිඥවරයාට කලින් දැන්වීම කළ යුතු වේ.

*ඔබ බාලවයස්කරුවකු වන්නේ නම් සහ ඔබ හෝ ඔබගේ පවුලේ අය නීතිඥවරයකු තෝරා ගෙන නොමැති අවස්ථාවක නීතිඥවරයකු පත් කිරීම සිදු කෙරෙනු ඇත.*

### නිශ්ශබ්ද ව සිටීමට ඇති අයිතිය

විභාග කිරීම් අතරතුර, ප්‍රකාශ සිදු කිරීම, ඔබෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම හෝ නිශ්ශබ්ද ව සිටීමට ඔබට අයිතියක් ඇත.

### භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

### ඔබව නිදහස් කිරීමට ඉල්ලා සිටීමට ඔබට ඇති අයිතිය

පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගෙන් ඔබගේ නිදහස් කිරීම සම්බන්ධයෙන් ඕනෑ මොහොතක ඉල්ලීමක් කළ හැක. මේ ඉල්ලීම එකී විනිසුරුවරයා හෝ සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් භාර විනිසුරුවරයා විසින් විභාග කරනු ලැබේ.

### මානුෂීය නිදහස පැහැර හැරිය හැකි කාල සීමාව

රිමාන්ඩ් භාරයේ රඳවා තබා ගත හැකි කාල සීමාව ඔබ වැඩිහිටියෙක් ද, බාලවයස්කරුවෙක් ද යන්න මත හෝ ඔබට එරෙහි ව චෝදනා නගා ඇති ක්‍රියා අපරාධයක් හෝ වරදක් සංස්ථාපනය කරන්නේ ද යන්න මත හෝ ඒවායේ බරපතළකම මත හෝ ඔබ සම්බන්ධයෙන් පෙර වැරදි ඇති හෝ නැති භාවය මත පදනම් ව වෙනස් වේ.

ඔබ ව රිමාන්ඩ් භාරයට පමුණුවනු ලබන විනිසුරුවරයාගේ තීන්දුව තුළ මෙම කාල සීමාව දක්වා සිටිනු ඇත.

සමහර අවස්ථා වල දී ඔබගේ රිමාන්ඩ් රැඳවුම් භාරය දිගු කිරීමට හැකියාව ඇත්තේ ය. ඔබ හෝ ඔබගේ නීතිඥවරයා විභාගයට ලක් කරන ලද, විභාගය අතරතුර ඇති වූ පරස්පර විරෝධී වචන හුවමාරුවක් අවසානයේ ඒ මත පමණක් පදනම් ව ඔබගේ ඉදිරි දීර්ඝ කිරීම් තීරණය කළ නොහැක්කේ ය.

## සමහර පුද්ගලයන් පිළිබඳ තොරතුරු

ඔබ විසින් රිමාන්ඩ් භාරයට පමුණුවනු ලදුව ඔබ කැමති පුද්ගලයකුට සහ විශේෂයෙන් ම ඔබගේ පවුලේ සාමාජිකයන්ට ඒ බව දැන්වීමට ඔබට අයිතියක් ඇත.

එසේ ම ඔබ විදේශිකයකු නම් ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමට ද ඔබට හැකියාව ඇත.

## වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීම

වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීමට ඔබට ඉල්ලීමක් කළ හැක.

## ඔබගේ නඩු ගොනුවට ඇති ප්‍රවේශය

ඔබගේ නීතිඥවරයා මාර්ගයෙන් (ඔබට එරෙහි ව ඇති) පරීක්ෂණයට අදාළ ලිපිගොනුවේ පිටපතක් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත්තේය. වින්දිතයන්, විභාගයට සහභාගී වූ පුද්ගලයන්, ඔවුන්ගේ නීතිඥවරුන්, ඔවුන්ගේ සාක්ෂිකරුවන්, පරීක්ෂණ නිලධාරීන්, විද්වතුන් හෝ ක්‍රියාවලියට සම්බන්ධ ඕනෑ ම පුද්ගලයකු පීඩාවට පත් වීමේ අවදානමක් ඇති අවස්ථාවක නඩු ගොනුවේ ඇතැම් කොටස් පිරික්සීමට විරුද්ධ වීමට පරීක්ෂණය පවත්වනු ලබන විනිසුරුවරයාට හැකියාව ඇත.